සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education - NWP

## තෙවන වාර පරීක්ෂණය - 12 ශ්‍රේණිය - 2024
## Third Term Test - Grade 12 - 2024

විභාග අංකය: ....................................

# ගිණුම්කරණය - I

කාලය පැය 02 යි

උපදෙස්:-

- අංක 01 සිට 30 තෙක් වූ ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තෝරා එහි අංකය ප්‍රශ්නය ඉදිරියේ ඇති තිත් ඉර මත ලියන්න.
- අංක 31 සිට 50 තෙක් වූ ප්‍රශ්නවලට කෙටි පිළිතුරුඅදාළ තිත් ඉරි මත ලියන්න.
- සෑම ප්‍රශ්නයකටම ලකුණු හතර බැගින් හිමි වේ.
- විභාග අංකය ඉහළින් ඇති තිත් ඉර මත පැහැදිලි ව සටහන් කරන්න.

| ප්‍රශ්න අංකය | ලකුණු |
|---|---|
| 01 - 30 | |
| 31 - 50 | |
| එකතුව | |

(01) ආයතනයක ගිණුම්කරණය භාවිත කිරීමෙන් ලැබෙන ප්‍රයෝජනයක් **නොවන්නේ,**

(1) තීරණ ගැනීමට ඇල්මැති පාර්ශවයන්ට තොරතුරු ලබාගත හැකිය.
(2) ආයතනයේ සම්පත් පාලනය කළ හැකිවීම.
(3) ගණුදෙනු සම්බන්ධයෙන් සිදුවන වංචාවන් හඳුනාගත හැකි වීම.
(4) කාලච්ඡේදයේ ලාභය ඉහළ නංවාගත හැකිවීම.
(5) ව්‍යාපාරය පිළිබඳ විනිශ්වයන්ට එළඹීමට තොරතුරු ලබගත හැකිය. (......)

(02) ගිණුම්කරණය ප්‍රයෝගික කාර්යයන් කිහිපයක එකතුවකි. ඒවා ගිණුම්කරණ ක්‍රියාවලිය ලෙස හඳුන්වයි. ගිණුම්කරණ ක්‍රියාවලියේ පහත සඳහන් කාර්යයන් සිදුකරනු ලබන නිවැරදි අනුපිළිවෙල කුමක් ද?

A - උපයෝගී පොත්වල වාර්තා කිරීම.
B - ශේෂ පිරික්සුම පිළියෙල කිරීම.
C - මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම.
D - ලෙජරයට පිටපත් කිරීම.

(1) ABCD (2) ABDC (3) ACBD (4) ADBC (5) ADCB (......)

(03) මෝටර් රථ අළෙවිකරණ ව්‍යාපාරයක සිදුවූ ගණුදෙනු කිහිපයක් පහත දක්වා ඇත.

A - 'ටොයෝටා' සමාගමෙන් විකිණීම සඳහා ණයට මිලදී ගෙන තිබූ මෝටර් රථයක් ඇණවුම්කළ වර්ණය නොවූ නිසා ආපසු යැවීම.
B - 'ටොයෝටා' සමාගමට මුදල් ගෙවීමේදී වට්ටමක් ලැබීම.
C - කළමණාකරුගේ භාවිතය මෝටර් රථයක් ණයට ගැනීම.

ඉහත ගණුදෙනු සටහන් කිරීමට අවශ්‍යවන මූලික සටහන් පොත් පිළිවෙලින් දක්වෙන පිළිතුර වන්නේ,

(1) ආපසු යැවුම් ජ'නලය, පොදු ජ'නලය, පොදු ජ'නලය
(2) ආපසු යැවුම් ජ'නලය, මුදල් ගෙවීම් ජ'නලය, පොදු ජ'නලය
(3) ආපසු යැවුම් ජ'නලය, පොදු ජ'නලය, ගැනුම් ජ'නලය
(4) ආපසු එවුම් ජ'නලය, මුදල් ගෙවීම් ජ'නලය, මුදල් ගෙවීම් ජ'නලය
(5) ආපසු එවුම් ජ'නලය, මුදල් ගෙවීම් ජ'නලය, පොදු ජ'නලය (......)

(04) මූල්‍ය තත්ත්ව ප්‍රකාශය තුළ ඉඩම් හා ගොඩනැගිලි ජංගම නොවන වත්කම් ලෙසත්, ඉතිරි භාණ්ඩ තොගය ජංගම වත්කම් ලෙසත් වර්ගකර තිබුණි. මේ සඳහා බලපෑ **ගිණුම්කරණ සංකල්පය** කුමක් ද?

(1) උපචිත සංකල්පය
(2) ගැලපුම් සංකල්පය
(3) මූල්‍ය මිනුම් සංකල්පය
(4) අඛණ්ඩ පැවැත්ම සංකල්පය
(5) විචක්ෂණ සංකල්පය (......)

(05) 'වයඹ ලංකා සමූහ ව්‍යාපාරය' සතුව මුද්‍රණ ආයතනයක් සහ විදේශ රැකියා නියෝජිත ආයතනයක් පවතී. මෙම ආයතන දෙකම අයිති එක් පුද්ගලයකුට නමුත් මෙම ආයතන දෙකේ ලාභය වෙන වෙනම ගණනය කරනු ලබයි. එයට බලපාන ගිණුම්කරණ සංකල්පය වන්නේ,

(1) කාලච්ඡේද සංකල්පය (2) ඒකක සංකල්පය
(3) ඓතිහාසික පිරිවැය සංකල්පය (4) මූල්‍ය මිනුම් සංකල්පය
(5) ආරක්ෂණ සංකල්පය (......)

(06) ඇල්මැති පාර්ශවයන් ලෙස 'සැලසුම් නිසි පරිදි ක්‍රියාත්මක වන්නේ ද? යන්න දැනගැනීමට ගිණුම්කරණයෙන් තොරතුරු අපේක්ෂා කරන්නේ,

(1) අයිතිකරුවන්ය (2) කළමනාකරුවන්ය (3) සේවකයින්ය
(4) තරඟකරුවන්ය (5) මූල්‍ය ආයතනයන්ය (......)

(07) මූල්‍ය ගිණුම්කරණ ක්‍රියාවලියේ කාර්යයන් නිවැරදි අනුපිළිවෙලට දක්වා ඇති පිළිතුර වන්නේ,

(1) හඳුනා ගැනීම හා මැනීම, සටහන් කිරීම, සාරාංශ කිරීම, වර්ග කිරීම
(2) හඳුනා ගැනීම හා මැනීම, වර්ග කිරීම, සටහන් කිරීම, සාරාංශ කිරීම
(3) හඳුනා ගැනීම හා මැනීම, සටහන් කිරීම, වර්ග කිරීම, සාරාංශ කිරීම
(4) සාරාංශ කිරීම, වර්ග කිරීම, සටහන් කිරීම, හඳුනා ගැනීම හා මැනීම
(5) සාරාංශ කිරීම, වර්ග කිරීම, හඳුනා ගැනීම හා මැනීම, සටහන් කිරීම (......)

(08) සීමිත කවිඳු සමාගම 2023/01/01 දින රු. 400 000 ක් වටිනා යන්ත්‍රයක්, ණයට ගත් අතර, 2023/12/31 දින රු. 10 000 ක පොලිය ඇතුලුව රු. 30 000 ක ණය වාරිකයක් ගෙවා ඇත. 2023/12/31 දිනට ඉහත ගණුදෙනු වල ශුද්ධ බලපෑම නිවැරදිව දැක්වෙන ගිණුම්කරණ සමීකරණය වන්නේ,

| | වත්කම් (රු.) | | හිමිකම් (රු.) | + | වගකීම් (රු.) |
|---|---|---|---|---|---|
| (1) | 370 000 | = | - 30 000 | + | 400 000 |
| (2) | 370 000 | = | - 10 000 | + | 380 000 |
| (3) | 380 000 | = | - 10 000 | + | 390 000 |
| (4) | 400 000 | = | - 20 000 | + | 400 000 |
| (5) | 400 000 | = | - 30 000 | + | 430 000 |

(......)

(09) ව්‍යාපාරයක සිදු වූ ගණුදෙනු දෙකකින් ගිණුම්කරණ සමීකරණයට සිදුවූ බලපෑම පහත දක්වා ඇත.

| | වත්කම් | = | හිමිකම් (රු.) | + | වගකීම් (රු.) |
|---|---|---|---|---|---|
| (A) | - 25 000 | = | - | | - 25 000 |
| (B) | +10 000 | = | +10 000 | | |

ඉහත දක්වා ඇති ගනුදෙනු දෙක වන්නේ,

| | A ගනුදෙනුව | B ගනුදෙනුව |
|---|---|---|
| (1) | රු. 25 000 ක භාණ්ඩ ණයට ගැනීම | රු. 10 000 ණය ආපසු ගෙවීම. |
| (2) | රු. 25 000 ක ණය ආපසු ගෙවීම | රු. 10 000 ක කුලී ආදායමක් ලැබීම. |
| (3) | රු. 25 000 ක අයිතිකරු පෞද්ගලික ප්‍රයෝජනයට මැනීම. | රු. 10 000 ක් ණය හිමියන්ට ගෙවීම. |
| (4) | රු. 25 000 ක ණයක් ගැනීම | රු. 10 000 ක වැටුප් ගෙවීම. |
| (5) | රු. 25 000 ක ණය ආපසු ගෙවීම | රු. 25 000 ක් පිරිවැය වූ භාණ්ඩ. රු. 15 000 කට අත්පිට විකිණීම. |

(......)

(10) 'ජනසිරි' 2023/04/01 දින රු. 700 000 ක් යොදා ව්‍යාපාරයක් ආරම්භ කරන ලදී. 2024/03/31 දිනට ව්‍යාපාරයේ වත්කම් රු. 1500 000 ක් වූ අතර, වගකීම් වල වැඩි වීම රු. 300 000 කි. කාලච්ඡේදය තුළ අයිතිකරු රු. 40 000 ක් අමතර ප්‍රාග්ධනය ලෙස යොදවා ඇති අතර, රු. 140 000 ක් ගැනිලි කර ඇත. කාලච්ඡේදයේ ශුද්ධ ලාභය කොපමණ ද?

(1) රු. 400 000 (2) රු. 600 000 (3) රු. 1100 000 (4) රු. 1200 000 (5) රු. 1300 000 (......)

- **ප්‍රශ්න අංක 11 සහ 13 යන ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමට පහත තොරතුරු උපයෝගී කරගන්න.**

කුසල්ගේ ව්‍යාපාරයේ 2024/03/31 දිනට බැංකු ප්‍රකාශයට අනුව ශේෂය රු. 320 000 ක් වූ නමුත්, එය එදිනට මුදල් පාලන ගිණුමේ ශේෂය හා සමාන නොවීය. මුදල් පාලන ගිණුම හා බැංකු සැසඳුම් ප්‍රකාශනය අතර පහත වෙනස්කම් හඳුනාගෙන ඇත.

- 2024/03/31 දිනට උපලබ්ධි නොවූ චෙක්පත් රු. 110 000 ක් හා ඉදිරිපත් නොවූ චෙක්පත් රු. 80 000 ක් විය.
- ව්‍යාපාරය නිකුත් කළ රු. 25 000 ක චෙක්පත් මුදල් ගෙවීම් ජ'නලයේ රු. 15 000 ක් ලෙස සටහන් කර ඇතත් බැංකුව නිවැරදි වටිනාකම ගෙවා ඇත.
- බැංකු ගාස්තු රු. 1 000 ක් අයකර ඇති අතර, ස්ථාවර නියෝග මත ගෙවූ රක්ෂණ වාරිකය රු. 2 000 කි.

(11) 2024/3/31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ දැක්විය යුතු මුදල් ශේෂය කොපමණ ද?
(1) රු. 290 000 (2) රු. 292 000 (3) රු. 320 000 (4) රු. 304 000 (5) රු. 350 000 (......)

(12) 2024/3/31 දින ව්‍යාපාරයේ මුදල් පාලන ගිණුමේ පැවති ශේෂය කොපමණ ද?
(1) රු. 304 000 (2) රු. 320 000 (3) රු. 344 000 (4) රු. 362 000 (5) රු. 363 000 (......)

(13) 2024/4/1 දින සුළු මුදල් අග්‍රිම ක්‍රමය ආරම්භ කරන ලද අමායාගේ ව්‍යාපාරයේ සුළු මුදල් අග්‍රිමය රු. 15 000 කි. අග්‍රිමය ප්‍රමාණවත් නොවූ බැවින් 2024 මැයි මාසයේ සිට අග්‍රිමය රු. 5 000 කින් වැඩි කිරීමට තීරණය කරන ලදී. 2024/5/1 දින ප්‍රතිපූර්ණය කරන ලද මුදල රු. 19 500 කි. 2024/5/31 දිනට සුළු මුදල් ශේෂය රු.1 500 කි. අප්‍රේල් මාසයේ සිට මැයි මාසය දක්වා සුළු මුදල් වියදමේ අඩුවීම හෝ වැඩිවීම කොපමණ ද?
(1) රු. 4 000 ක වැඩි වීමකි. (2) රු. 4 000 ක අඩු වීමකි. (3) රු. 5 000 ක වැඩි වීමකි.
(4) රු. 5 000 ක අඩු වීමකි. (5) රු. 18 500 ක වැඩි වීමකි. (......)

(14) එකතු කල අගය මත බදු (VAT) සඳහා ලියාපදිංචි සමන්තගේ ව්‍යාපාරයේ 2024 මාර්තු මාසයේ සිදු වූ ගනුදෙනු කිහිපයක් ඔබට දී ඇත.

- 10% ක VAT සහිතව අත්පිට විකුණුම් රු. 550 000 කි.
- 10% ක VAT සහිත ණයට විකුණුම් රු. 330 000 කි.
- ආදායම් බදු දෙපාර්තමේන්තුවට VAT සඳහා ගෙවීම රු. 10 000 කි.

2024/3/31 දිනට VAT පාලන ගිණුමේ ශේෂය,
(1) රු. 10 000 ක වත්කමකි. (2) රු. 10 000 ක වගකීමකි. (3) රු. 30 000 ක වත්කමකි.
(4) රු. 30 000 ක වගකීමකි. (5) රු. 190 000 ක වත්කමකි. (......)

(15) ව්‍යාපාරයක ගිණුම් පිළියෙල කිරීමේදී සිදු වූ වැරදි කිහිපයක් පහත දක්වා ඇත.
A - ලද වට්ටම් ගිණුමේ ශේෂය රු. 2 000 ක් අඩුවෙන් එකතු කර ඇත.
B - රු. 3 000 ක බොල්ණය කපාහැරීම, එම ගිණුමට බැර කර ඇත.
C - කොමිස් ආදායම් රු. 5 000 ක්, එම ගිණුමේ වාර්තා වී නැත.
ඉහත වැරදි අතරින් අවිනිශ්චිත ගිණුමේ බැර ශේෂයක් ඇතිවීමට හේතුවන වැරදි වන්නේ,
(1) A පමණි. (2) B පමණි. (3) B හා C පමණි.
(4) A හා C පමණි. (5) A, B, C සියල්ලම. (......)

(16) සංකල්පනාගේ ව්‍යාපාරයේ, ගිණුම් තැබීමේදී සිදු වූ වැරදි කිහිපයක් පහත ලබාදී ඇත.

- රු. 50 000 ක ගොඩනැගිලි අළුත්වැඩියාව, ගොඩනැගිලි ගිණුමට හර කර ඇත.
- රු. 10 000 ක විකුණුම් ඉන්වොසියක් පොත්වලින් මඟ හැරී ඇත.
- රු. 40 000 ක ණයගැති ලැබීම, ගිණුම්වල දෙවරක් සටහන් වී ඇත.

ඉහත වැරදි නිවැරදි කිරීමෙන් පසු ශුද්ධ ලාභයට වන බලපෑම කොපමණ ද?
(1) රු. 10 000 කින් වැඩිවේ. (2) රු. 40 000 කින් වැඩිවේ. (3) රු. 40 000 කින් අඩු වේ.
(4) රු. 50 000 කින් වැඩිවේ. (5) රු. 65 000 කින් අඩු වේ. (......)

- **2023 අප්‍රේල් මාසයේ 'ප්‍රියා' සමාගමේ පොත්වලින් පහත සඳහන් ණයහිමි තොරතුරු උපුටාගන්නා ලදී. ඒ ඇසුරින් 17 සහ 18 ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

| | සංක | අසංක | සසංක |
|---|---|---|---|
| 2023 අප්‍රේල් 01 දිනට ශේෂය රු. | 13 000 | 10 000 | - |
| මිලදී ගැනුම් (ලකුණු කළ මිල) රු. | 6 000 | 4 000 | 5 000 |
| මුදලින් ගෙවීම් රු. | 10 000 | 6 000 | 4 000 |
| ලද වට්ටම් රු. | 400 | 200 | - |

- මිලදී ගැනීමේදී ලකුණු කළ මිලෙන් 20% වෙළඳ වට්ටම් අඩු කරනු ලැබේ.

(17) අප්‍රේල් මාසයේ ණයහිමි පාලන ගිණුමේ ශේෂය කොපමණ ද?

(1) රු. 14 400 බැර (2) රු. 14 400 හර (3) රු. 15 600 බැර
(4) රු. 15 600 හර (5) රු. 16 000 බැර (......)

(18) ණය හිමි අසංකට නිකුත් කළ චෙක්පත අගරු වී ඇත. එම අගරු වීම වාර්තා කිරීමේ නිවැරදි ද්විත්ව සටහන වන්නේ,

(1) ණය හිමි පාලන ගිණුම හර රු. 6 200
මුදල් ගිණුම බැර රු. 6 000
ලද වට්ටම් බැර රු. 200

(2) මුදල් ගිණුම හර රු. 6 000
ලද වට්ටම් ගිණුම හර රු. 200
ණය හිමි පාලන ගිණුම බැර රු. 6 200

(3) ණය හිමි පාලන ගිණුම හර රු. 6 000
මුදල් ගිණුම බැර රු. 5 800
ලද වට්ටම් බැර රු. 200

(4) මුදල් ගිණුම හර රු. 5 800
ලද වට්ටම් ගිණුම හර රු. 200
ණය හිමි පාලන ගිණුම බැර රු. 6 000

(5) ලද වට්ටම් ගිණුම හර රු. 200
ණය හිමි පාලන ගිණුම බැර රු. 200 (......)

(19) 'අමිත් ට්‍රේඩර්ස්' හී ණයගැති පාලන ගිණුමේ 2024/3/31 දිනට ශේෂය රු. 95 000 ක් විය. නමුත් එදිනට ශේෂ ලැයිස්තුවේ එකතුව ඊට වඩා වෙනස් අගයක් ගත් නිසා ලෙජර පරීක්ෂාකොට පහත වැරදි හඳුනාගෙන ඇත.

A - විකුණුම් ජ'නලය රු. 50 000 ක් වැඩියෙන් එකතු කර ඇත.

B - ණය ගැති සංගීත් ගෙන් ලද මුදල් රු. 4 000 ඔහුගේ ගිණුමේ සටහන් කර නැත.

C - එකතු කළ අගය මත බදු (VAT) 15% ඇතුලුව රු. 34 500 ක විශ්වට කළ විකුණුම් ඔහුගේ ගිණුමේ නිවැරදිව සටහන් කළත්, විකුණුම් ජ'නලයේ සටහන් කර තිබුනේ VAT රහිත අගයයි.

2024/3/31 දිනට ණයගැති ශේෂ ලැයිස්තුවේ පැවති ශේෂය කොපමණ ද?

(1) රු. 44 500 (2) රු. 45 500 (3) රු. 53 500 (4) රු. 136 500 (5) රු. 144 500 (......)

(20) චානක ට්‍රේඩර්ස් මගින් 2024/3/31 දිනට උපුටා ගන්නා ලද ශේෂ පිරික්සුම සම නොවූයෙන් වෙනස අවිනිශ්චිත ගිණුමකට මාරු කරන ලදී. පසුව පහත වැරදි සිදුවී ඇතිබව සොයා ගන්නා ලදී.

- විකුණුම් ජ'නලය රු. 50 000 කින් අඩුවෙන් එකතු කර ඇත.
- සේවක වැටුප් සඳහා නිකුත් කරන ලද රු. 25 000 චෙක්පත් මුදල් ගිණුමේ නිවැරදිව සටහන් කළද, වියදම් ගිණුමේ සටහන් කර නැත.
- උපචිත විදුලිය රු. 5 000 ක් පොදු ජ'නලයේ දෙවරක් ඇතුළත් කර ඇත.

මෙම ව්‍යාපාරයේ ශේෂ පිරික්සුමේ අසමාන වූ වටිනාකම වන්නේ,

(1) හර 15 000 (2) බැර 15 000 (3) හර 25 000 (4) බැර 25 000 (5) බැර 33 000 (......)

iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources

(21) ගණුදෙනුවට අදාල ද්විත්ව සටහන නිවැරදිව දක්වා නැති වගන්තිය කුමක් ද?

| | ගනුදෙනුව | හර වන ගිණුම | බැර වගකීම |
|---|---|---|---|
| (1) | අත්පිට මුදලට භාණ්ඩ ගැනීම රු. 20 000 | ගැනුම් ගිණුම | මුදල් ගිණුම |
| (2) | ණයට භාණ්ඩ ගැනීම රු. 30 000 | ගැනුම් ගිණුම | ණය හිමි පාලන ගිණුම |
| (3) | අත්පිට මුදලට භාණ්ඩ විකිණීම රු. 50 000 | මුදල් ගිණුම | විකුණුම් ගිණුම |
| (4) | ණයට භාණ්ඩ විකිණීම රු. 40 000 | ණයහිමි පාලන ගිණුම | විකුණුම් ගිණුම |
| (5) | දුරකථන බිල ලැබීම රු. 2 000 | දුරකථන ගාස්තු ගිණුම | උපචිත දුරකථන ගාස්තු ගිණුම |

(......)

(22) ව්‍යාපාරයක මූල්‍ය ප්‍රකාශනයක් ලෙස සැලකිය හැකි අයිතමය තෝරන්න.
(1) මුදල් ලැබීම් ජ'නලය (2) බැංකු සැසඳුම් ප්‍රකාශය (3) ශේෂ පිරික්සුම
(4) ලාභ හෝ අලාභ ප්‍රකාශනය (5) පොදු ජ'නලය (......)

(23) දිදුලගේ ව්‍යාපාරයේ 2024/4/1 දිනට රු. 500 ක උපචිත විදුලි වියදමක් පැවති අතර 2024/4/30 දිනට රු. 1 000 ක උපචිත විදුලි වියදමක් පවතී. අප්‍රේල් මාසය තුළ දිදුලගේ නිවසේ විදුලි බිල රු. 2 000 ක් ද ඇතුලුව විදුලිය සඳහා රු. 4 500 ක් ගෙවන ලදී. ව්‍යාපාරයේ ආදායම් ප්‍රකාශයේ සටහන් කළ යුතු විදුලි වියදම කොපමණ ද?
(1) රු. 2 000 (2) රු. 2 500 (3) රු. 3 000 (4) රු. 3 500 (5) රු. 4 500 (......)

(24) වෙළඳ සංගමයක ශේෂ පිරික්සුමේ පහත වියදම් දක්නට ලැබේ.
A - ප්‍රචාරණය B - කල්බදු පොලිය
C - කාර්යාල කුලී D - ගැණුම්
D - ගෙන ඒමේ කුලී F - සේවකයින් ප්‍රවාහනය කරන මෝටර් රථයේ නඩත්තු
ඉහත වියදම් වල නිවැරදි වර්ගීකරණය වන්නේ,

| | වියදම් පිරිවැය | බෙදා හැරීමේ පිරිවැය | පරිපාලන වියදම් | මූල්‍ය වියදම් |
|---|---|---|---|---|
| (1) | A, D | E | C | B, F |
| (2) | D, E | A | C, F | B |
| (3) | D, E | A, F | C | B |
| (4) | D, F | A | C | B |
| (5) | B, E | A, F | D | C |

(......)

(25) තනි පුද්ගල ව්‍යාපාරයක් වන 'දනුක ට්‍රේඩර්ස්' සේවක අර්ථ සාධක අරමුදලට (EPF) දායක වන ව්‍යාපාරයකි. සේවක දළ වැටුපෙන් කෙරෙන එකම අඩු කිරීම අර්ථසාධක අරමුදලට (EPF) 10% ක් දායක වීම පමණි. ආයතනය ද මෙම අරමුදලට 15% ක් දායක වේ. 2024/3/31 දිනෙන් අවසන් වර්ෂය තුළදී සේවකයින්ට රු. 2700 000 ක ශුද්ධ වැටුපක් ගෙවා ඇත. 2024/3/31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මෙම ව්‍යාපාරයේ දළ වැටුප සහ (EPF) වියදම කොපමණ ද?

| | දළ වැටුප (රු. 000) | (EPF) වියදම (රු. 000) |
|---|---|---|
| (1) | 2700 | 405 |
| (2) | 2700 | 450 |
| (3) | 3000 | 450 |
| (4) | 3000 | 750 |
| (5) | 3600 | 540 |

(......)

(26) 2024/3/31 දිනෙන් අවසන් වර්ෂය සඳහා 'කලුතර' බේකරියේ ගිණුම් පොත් වලින් උපුටාගත් තොරතුරු පහත දැක්වේ.

i) තොග සම්බන්ධ තොරතුරු,

| තොග වර්ගය | අවසාන ශේෂය සිදුවී ඇති බලපෑම | වටිනාකම (රු.000) |
|---|---|---|
| අමුද්‍රව්‍ය | අඩුවීම | 30 |
| නොනිමි | වැඩිවීම | 15 |
| නිමි | අඩුවීම | 20 |

iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources

ii) අමුද්‍රව්‍ය ගැනුම් රු. 130 000.

iii) ඍජු ශ්‍රම පිරිවැය රු. 70 000.

iv) නිෂ්පාදන පොදුකාර්ය පිරිවැය රු. 35 000.

v) වෙනත් ඍජු වියදම් රු. 30 000

නොනිමි තොගය අගය කරනු ලබන්නේ, මුළු නිෂ්පාදන පිරිවැය මත පදනම් ව නම්, 2024/3/31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ප්‍රාථමික පිරිවැය සහ මුළු නිෂ්පාදන පිරිවැය කොපමණ ද?

| | ප්‍රාථමික පිරිවැය (රු.000) | මුළු නිෂ්පාදන පිරිවැය (රු.000) |
|---|---|---|
| (1) | 200 | 220 |
| (2) | 200 | 250 |
| (3) | 215 | 250 |
| (4) | 260 | 280 |
| (5) | 260 | 310 |

(......)

- **ප්‍රශ්න අංක 27 සහ 28 යන ප්‍රශ්නවලට පිළිතුරු ලිවීමට පහත තොරතුරු යොදාගන්න.**

2023/1/1 දිනට BRS ක්‍රීඩා සමාජයේ සාමාජිකයින් 165 ක් සිටී. සාමාජිකයකු වර්ෂය සඳහා රු. 6 000 ක සාමාජික මුදල් ගෙවිය යුතුය. 2023/12/31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සාමාජික මුදල් සම්බන්ධ තොරතුරු පහත දැක්වේ.

- ප්‍රවර්තන වර්ෂය තුලදී නව සාමාජිකයින් 25 ක් ඇතුලත් කරගන්නා ලද අතර, ඔවුන් විසින් වර්ෂ දෙකක් සඳහා වාර්ෂික සාමාජික මුදල් එකවර ගෙවන ලදී.
- 2023/1/1 දිනට සාමාජිකයින් 15 දෙනෙකුගෙන් සාමාජික මුදල් ලැබිය යුතුව තිබුණි. මෙම සාමාජිකයින් අතුරෙන් 10 දෙනෙකු පෙර වර්ෂයේ හිඟ සාමාජික මුදල් සහ ප්‍රවර්තන වර්ෂය සඳහා සාමාජික මුදල්, 2023/12/31 දින වන විටත් නොගෙවීම නිසා ඔවුන්ගේ සාමාජිකත්වය අහෝසි කරන ලදී.
- 2023/1/1 දිනට හිඟ වාර්ෂික සාමාජික මුදල් ලැබිය යුතු 15 දෙනාගෙන් ඉතිරි සාමාජිකයන් 5 දෙනා හිඟ සාමාජික මුදල් සහ ප්‍රවර්තන වර්ෂය සඳහා සාමාජික මුදල් ගෙවන ලදී.
- සාමාජිකයින් 12 දෙනෙකු ප්‍රවර්තන වර්ෂයේ සාමාජික මුදල් ගෙවා නොතිබුණි.

(27) 2023/12/31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුදලින් ලද සාමාජික මුදල කොපමණ ද? (රු. 000)

(1) 858 (2) 990 (3) 1008 (4) 1188 (5) 1830 (......)

(28) 2023/12/31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම් ප්‍රකාශයේ දැක්විය යුතු සාමාජික මුදල් ආදායම, හිඟ සාමාජික මුදල හා ඉදිරියට ලද සාමාජික මුදල් පිළිවෙලින් දැක්වෙන පිළිතුර තෝරන්න.

| | ආදායම් ප්‍රකාශයේ සාමාජික මුදල් ආදායම (රු.000) | හිඟ (රු.000) | ඉදිරියට ලද (රු.000) |
|---|---|---|---|
| (1) | 858 | 90 | 150 |
| (2) | 1080 | 72 | 150 |
| (3) | 1080 | 60 | 300 |
| (4) | 1140 | 162 | 300 |
| (5) | 1140 | 72 | 150 |

(......)

(29) 1890 හවුල් ව්‍යාපාර ආඥාපනතේ, 24 වගන්තියට අනුව කුමන ප්‍රකාශ **අසත්‍ය** වේ ද?

A - හවුල් කරුවන් කළමනාකරණය සඳහා දායක වූ විට ඔවුන්ට ලාභයෙන් 5% ක වැටුපක් ලැබීමට හිමිකම් ලබයි.

B - හවුල් කරුවන් හවුල් ව්‍යාපාරයට ලබාදුන් ණය සඳහා 5% ක පොලියකට හිමිකම් ලබයි.

C - හවුල් කරුවකු විශ්‍රාමයන විට ගෙවිය යුතු මුදල පියවා නොමැතිව ණයක් ලෙස තබා ගැනීමේදී ඒ සඳහා 5% ක පොලියකට හිමිකම් ලබයි.

D - හවුල් කරුවකුගේ පෞද්ගලික වියදමක් ව්‍යාපාරය ගෙවා ඇත්නම්, එය ඔහුගේ ජංගම ගිණුමෙන් හිලව් කළ යුතුය.

(1) A, C, D පමණි. (2) A, B, C පමණි. (3) B, C, D පමණි.

(4) C, D පමණි. (5) A, B, C, D සියල්ලම. (......)

(30) ආතර් සහ මර්ලින් විසින් පවත්වාගෙන යන හවුල් ව්‍යාපාරයේ හවුල් ගිවිසුමේ පහත එකඟතා පැවතුණි.

i) ආතර්ට මාසිකව රු. 10 000 ක වේතනයක් හිමිවේ.

ii) ලාභාලාභ ආතර් සහ මර්ලින් අතර 2:1 අනුපාතයට බෙදාගැනීම.

iii) ආතර්ට වාර්ෂිකව රු. 100 000 ක් හා මර්ලින්ට වාර්ෂිකව රු. 80 000 ක ප්‍රාග්ධන පොලියක් ගෙවීම.

ව්‍යාපාරයේ 2024/3/31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විකුණුම් ආදායම රු. 2000 000 ක් විය. එසේම විකුණුම් පිරිවැය රු. 1200 000 ක් විය. මෙම වර්ෂයේ කිසිදු අමතර ආදායමක් නොමැති අතර, ගැනිලි හෝ අමතර ප්‍රාග්ධන යෙදවීමක් ද සිදු වී නැත. කාලච්ඡේදයේ මුළු මෙහෙයුම් වියදම රු. 200 000 කි.

2024/3/31 දිනෙන් අවසන් වර්ෂය තුළ හවුල්කරුවන්ගේ හිමිකම වැඩිවන්නේ කොපමණකින් ද?

| | ආතර් (රු.) | මර්ලින් (රු.) |
|---|---|---|
| (1) | 180 000 | 140 000 |
| (2) | 330 000 | 270 000 |
| (3) | 420 000 | 180 000 |
| (4) | 420 000 | 240 000 |
| (5) | 180 000 | 420 000 |

(......)

- **අංක 31සිට 50 දක්වා වූ ප්‍රශ්නවලට කෙටි පිළිතුරු තිත් ඉර මත ලියන්න.**

31. ව්‍යාපාර ආයතනයක් පිළිබඳ ඇල්මක් දක්වන පාර්ශවයන් හා එසේ ඇල්මක් දැක්වීමට හේතු පවතී. පහත දක්වා ඇති තොරතුරු අවශ්‍ය වන ඇල්මැති පාර්ශවය සඳහන් කරන්න.

| ඇල්මැති පාර්ශවයට අවශ්‍ය වන තොරතුර | ඇල්මැති පාර්ශවය |
|---|---|
| A - ආයෝජනයට සරිලන ප්‍රතිලාභයක් ලබා තිබේද? | ................................................... |
| B - සැලසුම් නිසි පරිදි ක්‍රියාත්මක වන්නේ ද? | ................................................... |
| C - රැකියාවේ සුරක්ෂිත බවක් තිබේද? | ................................................... |
| D - නියමිත පරිදි බදු ගෙවන්නේ ද? | ................................................... |

32. අශේන් ගේ ව්‍යාපාරයේ පහත සඳහන් ගනුදෙනු නිසා වත්කම්, වගකීම් හා හිමිකමට ඇතිකරන බලපෑම අඩුවේද, වැඩිවේද වෙනස් නොවේද යන්න සඳහන් කරන්න.

| ගනුදෙනුව | වත්කම | වගකීම් | හිමිකම් |
|---|---|---|---|
| A - අයිතිකරු රු. 150 000 ක් යොදා ව්‍යාපාරයක් ඇරඹීම. | .......... | .......... | .......... |
| B - ව්‍යාපාරයේ කටයුතු සඳහා මෝටර් රථයක් මිලදී ගැනීම. | .......... | .......... | .......... |
| C - ව්‍යාපාරයේ කටයුතු සඳහා ලී බඩු කමල්ගෙන් ණයට ගැනීම. | .......... | .......... | .......... |
| D - ණය හිමියන් විසින් ප්‍රමාද පොලී අයකිරීම. | .......... | .......... | .......... |

33. පහත දැක්වෙන්නේ ගණුදෙනු දෙකක් නිසා ගිණුම්කරණ සමීකරණයේ සිදු වූ වෙනස් වීම් ය.

| | තොගය (රු.) | = | හිමිකම (රු.) | + | වෙළඳ ගෙවිය යුතු දෑ (රු.) |
|---|---|---|---|---|---|
| i) | + 25 000 | = | | + | 25 000 |
| ii) | | = | - 2 500 | + | 2 500 |

ඉහත සඳහන් ගණුදෙනු දෙක විස්තර කරන්න.

i) ..........................................................................................................................

ii) ..........................................................................................................................

34. පහත සඳහන් ගණුදෙනු වාර්තාකරණ මූලික ලියවිල්ල සහ මූලික සටහන් පොත සඳහන් කරන්න.

| ගනුදෙනුව | මූලික ලියවිල්ල | මූලික සටහන් පොත |
|---|---|---|
| A - අයිතිකරු පෞද්ගලික ප්‍රයෝජනයට භාණ්ඩ ගැනීම. | ......................... | ......................... |
| B - සේවක වැටුප් ගෙවීම. | ......................... | ......................... |
| C - ණයට විකුණූ භාණ්ඩ ආපසු එවීම. | ......................... | ......................... |
| D - අත්පිට මුදලට භාණ්ඩ විකිණීම. | ......................... | ......................... |

35. අදාල තීරුවේ '✓' ලකුණ යොදමින් ආයතනයකට අදාලව පහත ප්‍රකාශ සත්‍ය හෝ අසත්‍ය බව දක්වන්න.

| ප්‍රකාශය | සත්‍යයි | අසත්‍යයි |
|---|---|---|
| A - භාණ්ඩ තොග විනාශ වූ විට ශුද්ධ ලාභය අඩුවේ. | ...................... | ...................... |
| B - විකුණුම් මත එකතු කළ අගය මත බද්ධ (VAT) ව්‍යාපාරයට ආදායමකි. | ...................... | ...................... |
| C - කලින් ලද ආදායම ව්‍යාපාරයට වගකීමකි. | ...................... | ...................... |
| D - වෙළඳ ලැබිය යුතු දෑ මත හානිකරන අලාභය නිසා හිමිකම අඩුවේ. | ...................... | ...................... |

36. පහත සඳහන් එක් එක් අවස්ථාවේදී වඩාත් හොඳින් අදාලවන ගිණුම්කරණ සංකල්පය සඳහන් කරන්න.

| අවස්ථාව | ගිණුම්කරණ සංකල්පය |
|---|---|
| A - ආදායම් ප්‍රකාශයේ ලාභ ගණනය කළ කාලය දැක්වීම. | ............................. |
| B - අයිතිකරුගේ පෞද්ගලික වියදම් ව්‍යාපාරය දැරීම ගැනිලි ලෙස සැලකීම. | ............................. |
| C - මෝටර් රථය අත්පත් කරගත් පිරිවැයටම මැනීම. | ............................. |
| D - තොගයක් පිරිවැය හා ශුද්ධ උපලබ්ධි යන අගයන් දෙකෙන් අඩු අගයට මැනීම | ............................. |

37. ආයතනයක් සුළු මුදල් ප්‍රතිපූර්ණ කරන දිනයේ සුළු මුදල් භාරකරු සතුව රු. 5 000 ක් තිබුණි. සුළු මුදල් භාරකරු පහත ගෙවීම් සිදුකර තිබුණි.

- අයිතිකරුගේ දරුවාගේ පන්ති ගාස්තු රු. 3 000
- ණය හිමි සමන්ට කළ ගෙවීම රු. 4 000
- ලිපි ද්‍රව්‍ය සඳහා රු. 2 000

මෙම ආයතනයේ සුළු මුදල් අග්‍රිමය සහ ප්‍රතිපූර්ණ කළ මුදල කීයද?

(අ) සුළු මුදල් අග්‍රිමය ................................................

(ආ) ප්‍රතිපූර්ණ කළ යුතු මුදල ................................................

- **අංක 38 සහ 39 ප්‍රශ්න වලට පිළිතුරු ලිවීමට පහත තොරතුරු භාවිතා කරන්න.**
  - අභිමන් ගේ ව්‍යාපාරයේ 2024 මාර්තු 01 දිනට මුදල් ගිණුමේ රු. 50 000 ක ශේෂයක් පැවතුණි.
  - මාසය තුළ සියලුම මුදල් ලැබීම් රු. 300 000 ක් වූ අතර මෙයින් රු. 60 000 ක චෙක්පත් නිෂ්කාශණය වී නොමැත.
  - මාසය තුළ ගෙවීම් සියල්ල චෙක්පත් මගින් සිදුකළ අතර එය රු. 150 000 කි. මින් බැංකුවට ඉදිරිපත් වී ගෙවා ඇත්තේ රු. 130 000 ක් වටිනා චෙක්පත් පමණි.
  - බැංකු ප්‍රකාශනයේ මාර්තු 31 දිනට රු. 150 000 ක ශේෂයක් පවතින අතර, බැංකුව බැංකු ගාස්තුවක් අයකර ඇත. මේ හැර වෙනත් මග හැරීම් හෝ වැරදි සිදුවී නැත.

38. ඉහත තොරතුරු වලට අනුව 2024/3/31 දිනට සංශෝධිත මුදල් ගිණුමේ ශේෂය කොපමණ ද?

.............................................................................................................................

39. මාර්තු මාසයේ බැංකුව අය කළ බැංකු ගාස්තුව කොපමණ ද?

.............................................................................................................................

40. ව්‍යාපාරයක සිදු වූ ගණුදෙනුවක හර සටහන පහත දැක්වේ.

දුන් වට්ටම් ගිණුම හර 500

මුදල් ගිණුම හර 4500

මෙම බැර සටහනට අදාල ගණුදෙනුව කුමක් ද?

..................................................................................................................................

41. පහත දැක්වෙන්නේ නිෂ්පාදන පිරිවැය මූලිකාංග දැක්වෙන සටහනකි.

1) (අ) ..........................................................

→ ඍජු ද්‍රව්‍ය | ඍජු ශ්‍රමය | ඍජු වෙනත් පිරිවැය

2) නිෂ්පාදන පොදු කාර්ය පිරිවැය

→ වක්‍ර ද්‍රව්‍ය පිරිවැය | වක්‍ර ශ්‍රම පිරිවැය | (ආ)...................

නිෂ්පාදන ව්‍යාපාරයක්වන හිමාලි ලී බඩු නිෂ්පාදන ව්‍යාපාරයේ පිරිවැය අයිතම පහත දැක්වේ.

A - ද්‍රව සඳහා පිරිවැය රු. 40 000

B - යන්ත්‍ර ක්ෂය රු. 5 000

C - වැලි කඩදාසි සහ පොලිෂ් වියදම රු. 2 000

D - වඩු කාර්මිකයාගේ වැටුප රු. 30 000

E - විදුලි වියදම රු. 2 000

මෙම ව්‍යාපාරය සම්බන්ධයෙන් ඉහත රූප සටහනේ (අ) සහ (ආ) ස්ථානවල පිරිවැය වටිනාකම් කොපමණ ද?

(අ) ..................................................................................................................................

(ආ) ..................................................................................................................................

42. 2023.04.01 දින ආරම්භ කරන ලද දලිකනුවාව ගමේ අවමංගල්‍යාධාර සමිතියේ සාමාජිකයින් 30 දෙනෙකු සිටින අතර ඉන් 10 දෙනෙකු යාවජීව සාමාජිකයන්ය. යාවජීවසාමාජිකයෙකු වීම සඳහා සාමාන්‍ය වාර්ෂික සාමාජික මුදල වන රු. 5000 මෙන් 10 ගුණයක් එකවර සමිතියට ගෙවා ඇත. බැඳුන වසරේ සිට වසර 10 ක් තුළ යාවජීව සාමාජික මුදල් ආදායම් ලෙස හඳුනාගනී.

ඉතිරි සාමාජිකයින් පහත පරිදි වසර තුළ සාමාජික මුදල් ගෙවා ඇත.

- 5 දෙනෙකු මාස 06 ක් සඳහා
- 8 දෙනෙකු වසරක් සඳහා
- 7 දෙනෙකු වසර දෙකක් සඳහා

2024/3/31 දිනෙන් අවසන් වර්ෂයේ සාමාජික මුදල් ආදායම හා මුදලින් ලද සාමාජික මුදල් කොපමණ ද?

(අ) සාමාජික මුදල් ආදායම ................................................

(ආ) මුදලින් ලද සාමාජික මුදල ................................................

43. ලාභ අරමුණු කර නොගත් සංවිධානවල පහත ගිණුම් අදාල වන ගිණුම්කරණ මූලිකාංග දක්වන්න.

| ගිණුමේ නම | මූලිකාංගය |
|---|---|
| A - සාමාජික මුදල් | ............................ |
| B - පරිත්‍යාගයන් ලෙස ලැබී ඇති මෝටර් රථය | ............................ |
| C - ලැබීම් හා ගෙවීම් | ............................ |
| D - ඉදිරියට ලද සාමාජික මුදල් | ............................ |

44. පහත සඳහන් වැරදි අමීන් පොදු සමාගම් 2024/3/31 දිනෙන් අවසන් වර්ෂය තුළ සිදු විය.

A - විකුණුම් ජ'නලයේ එකතුව රු. 3000 000 ණය ගැති පාලන ගිණුමට සහ විකුණුම් ගිණුමට පිටපත් කර ඇත්තේ, රු. 300 000 ලෙසය.

B - ණය ගැතියන්ට දුන් වට්ටම්, රු. 250 000 ණයගැති පාලන ගිණුමට හර කර ඇත.

ඉහත වැරදි නිවැරදි කිරීමේ ජ'නල් සටහන් ලියන්න. (සංලක්ෂය අවශ්‍ය නොවේ.)

| | | | |
|---|---|---|---|
| (A) | ........................................................................................ | ...................... | ...................... |
| | ........................................................................................ | ...................... | ...................... |
| (B) | ........................................................................................ | ...................... | ...................... |
| | ........................................................................................ | ...................... | ...................... |

- **අංක 45 සිට 47 දක්වා ප්‍රශ්න වලට පිළිතුරු සැපයීමට පහත තොරතුරු භාවිතා කරන්න.**

2023/04/01 දින උමාලා සමග සහ නිමාලා පිළිවෙලින් 3:2 අනුපාතයට ලාභාලාභ බෙදා ගනිමින් පවත්වාගෙන යන හවුල්ව්‍යාපාරයට කපිලා මුදලින් රු. 600 000 යොදා නව හවුල්කරුවකු ලෙස ඇතුලත් විය. එදින ව්‍යාපාරයේ කීර්ති නාමය රු. 600 000 ක් ලෙස ඇස්තමේන්තු කරන ලදී. කීර්ති නාමය ප්‍රාග්ධන ගිණුම තුළින් ගලපනු ලබයි.

නව හවුල් ගිවිසුමේ පහත කොන්දේසි ඇතුලත් විය.

A - උමාලා, නිමලා සහ කපිලා පිළිවෙලින් 3:2:1 අනුපාතයට ලාබාලාභ බෙදා ගනී.

B - එක් එක් හවුල් කරුවාට රු. 60 000 ක වාර්ෂික වේතනයක් හිමිවේ.

2024/03/31 දිනට සියලු ගනුදෙනු නිවැරදිව වාර්තා කිරීමෙන් පසුව ප්‍රාග්ධන හා ජංගම ගිණුම් වල පහත ශේෂ දක්නට ලැබුණි.

| | උමාලා (රු.) | නිමලා (රු.) | කපිලා (රු.) |
|---|---|---|---|
| ප්‍රාග්ධන ගිණුම | 1420 000 | 880 000 | 500 000 |
| ජංගම ගිණුම | 570 000 | 400 000 | 140 000 |

- කපිලා පමණක් වර්ෂය තුළ රු. 40 000 ක් ගැනිලි ලෙස මුදල් ලබාගන්නා ලදී.

45. 2023/04/01 දිනට හවුල් ව්‍යාපාරයේ කීර්ති නාමය ගැලපීමට අවශ්‍ය ජ'නල් සටහන් ලියා දක්වන්න. (සංලක්ෂය අවශ්‍ය නොවේ.)

..................................................................................................................................................

..................................................................................................................................................

..................................................................................................................................................

..................................................................................................................................................

..................................................................................................................................................

46. 2024/03/31 දිනෙන් අවසන් වර්ෂයේ හවුල් ව්‍යාපාරයේ ලාභය කොපමණද?

රු. ..............................................

47. 2023/03/31 දිනට හවුල් ව්‍යාපාරයේ පැවති මුළු හිමිකම කොපමණ ද?

රු. ..............................................

iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources

48. පහත ප්‍රකාශන සත්‍ය ද, අසත්‍ය ද යන්න දක්වන්න.

| ප්‍රකාශය | සත්‍යයි | අසත්‍යයි |
|---|---|---|
| A - මූල්‍ය ප්‍රකාශන වල ණය ගැතියන් හා ණය හිමියන් හඳුනාගැනීම සඳහා උපචිත සංකල්පය අදාල වේ. | .................. | .................. |
| B - වත්කම් හා වගකීම්, ජංගම හා ජංගම නොවන ලෙස වර්ගීකරණය කිරීමට පදනම වන්නේ කාලච්ඡේද සංකල්පයයි. | .................. | .................. |
| C - සේවකයින්ගේ නිපුණතා ව්‍යාපාරවල මූල්‍ය ප්‍රකාශනවල හඳුනා නොගැනීමට පදනම වන්නේ ගිණුම්කරණ ඒකක සංකල්පයයි. | .................. | .................. |
| D - ආරක්ෂණ සංකල්පයට අනුව අනාගත අලාභ වර්තමානයේ දී හඳුනා ගනී. | .................. | .................. |

- **අංක 49 සහ 50 දක්වා ප්‍රශ්න වලට පිළිතුරු සැපයීමට පහත තොරතුරු භාවිතා කරන්න.**

i) නුවන්ගේ ව්‍යාපාරයේ 2023/03/31 දිනට සාරාංශගත මූල්‍ය තත්ත්ව ප්‍රකාශය පහත දී ඇත.

| | (රු.000) |
|---|---|
| <u>වත්කම්</u> | |
| දේපල, පිරියත, උපකරණවල ධාරණ අගය | 6 000 |
| තොගය | 1 000 |
| වෙළඳ ලැබිය යුතු දෑ | 1 500 |
| බැංකුවේ ඇති මුදල් | 500 |
| | 9 000 |
| <u>හිමිකම් හා වගකීම්</u> | |
| ප්‍රාග්ධනය | 8 760 |
| වෙළඳ ගෙවිය යුතු දෑ | 240 |
| | 9 000 |

ii) 2024/03/31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපාරයේ ගනුදෙනු වල සාරාංශය.

| තොරතුරු | (රු.000) |
|---|---|
| විකුණුම් (මෙයින් 60% ක් ණය පදනම මත වේ) | 6 000 |
| ණයගැති ලැබීම | 2 500 |
| ගැනුම් (මෙයින් 80% ක් ණය පදනම මත වේ) | 3 000 |
| ණය හිමියන්ට ගෙවීම් | 1 240 |
| මුදලින් ගෙවූ මෙහෙයුම් වියදම් | 520 |
| දේපල පිරියත උපකරණ ක්ෂය | 1 000 |
| ගැනිලි (මුදල්) | 120 |

iii) 2024/03/31 දිනට තොගය රු. 750 000 ක් විය.

49. 2024/03/31 දිනට ව්‍යාපාරයේ පැවති වෙළඳ ලැබිය යුතු දෑ, වෙළඳ ගෙවිය යුතු දෑ සහ මුදල් ගිණුම්වල ශේෂයන් කොපමණ ද?

(අ) වෙළඳ ලැබිය යුතු දෑ රු. ..............................................

(ආ) වෙළඳ ගෙවිය යුතු දෑ රු. ..............................................

(ඉ) මුදල් රු. ..............................................

50. 2024/03/31 දිනෙන් අවසන් වර්ෂයේ නුවන්ගේ ව්‍යාපාරයේ ශුද්ධ ලාභය කොපමණ ද?

රු. ..........................................

සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

තෙවන වාර පරීක්ෂණය - 12 ශ්‍රේණිය - 2024
Third Term Test - Grade 12 - 2024

විභාග අංකය: ......................................

# ගිණුම්කරණය - II

කාලය පැය 03 යි
(අමතර කියවීම් කාලය විනාඩි 10 යි)

උපදෙස්:-

- පළමුවන ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.
- සෑම ප්‍රශ්නයකට ම පිළිතුරු ලිවීම අලුත් කඩදාසියකින් ආරම්භ කරන්න .
- අදාළ පෙරවැඩ පිළිතුරු පත්‍රය සමග අමුණන්න..

01. ආසිරි හා බිම්සර පවත්වාගෙන ගිය හවුල් ව්‍යාපාරයේ 2024/03/31 දිනට පිළියෙල කළ ශේෂ පිරික්සුම පහත දැක්වේ.

| | | හර (රු'000) | බැර (රු'000) |
|---|---|---|---|
| ප්‍රාග්ධන ගිණුම | ආසිරි | | 3 000 |
| | බිම්සර | | 2 500 |
| ජංගම ගිණුම් | ආසිරි | | 500 |
| | බිම්සර | | 400 |
| විකුණුම් | | | 5 700 |
| ණය ගිණුම (2023/04/01) ආසිරි | | | 1 000 |
| වෙළඳ ගෙවිය යුතු දෑ | | | 800 |
| ආපසු යැවුම් | | | 200 |
| ලැබූ ගොඩනැගිලි කුලී | | | 150 |
| ලද වට්ටම් | | | 100 |
| චාරුක ප්‍රාග්ධනය ලෙස යෙදූ වත්කම් | | | 2 000 |
| නිමි භාණ්ඩ ගැණුම් | | 2 400 | |
| නිමි තොගය (2023/04/01) | | 200 | |
| වෙළෙඳ ලැබිය යුතු දෑ | | 1 080 | |
| ආපසු එවුම් | | 200 | |
| නිෂ්පාදන පිරිවැය | | 1 200 | |
| බෙදා හැරීමේ පිරිවැය | | 390 | |
| පරිපාලන වියදම | | 1 100 | |
| අමුද්‍රව්‍ය තොගය (2024/03/31) | | 100 | |
| නොනිමි තොගය (2024/03/31) | | 150 | |
| ගෙවූ ණය පොලී | | 50 | |
| මුදල් හා මුදල් සමාන දෑ | | 1 400 | |
| ගැනිලි | ආසිරි | 300 | |
| | බිම්සර | 200 | |
| ගෙවූ ප්‍රාග්ධන පොලී | ආසිරි | 150 | |
| | බිම්සර | 100 | |
| දේපළ පිරියත උපකරණ | | 7 330 | |
| | | 16 350 | 16 350 |

www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources
iexamhub

**අතිරේක තොරතුරු :-**

- මූල්‍ය ප්‍රකාශය පිළියෙල කිරීමට පෙර පහත තොරතුරු සැලකිල්ලට ගත යුතුයි.

i. 2024/03/31 දිනට ඉතිරි නිමි තොග වල පිරිවැය රු. 500 000 කි.

ii. නිෂ්පාදන පිරිවැය ගණනය කිරීමේදී පිරිවැය රු. 100 000 ක අමුද්‍රව්‍ය තොග හානිය සැලකිල්ලට ගෙන නැත. 2024/03/31 දින අමුද්‍රව්‍ය තොග භෞතික පදනමට අගය කර ඇත.

iii. පරිපාලන වියදම් තුල ආසිරි හා බිම්සරට පිළිවෙලින් රු. 120 000 ක් හා රු. 80 000 ලෙස ගෙවූ හවුල් වේතන අන්තර්ගත වේ.

iv. උපචිත ප්‍රචාරණ වියදම් රු. 150 000 ක් වන අතර ඉදිරියට ගෙවූ රක්ෂණ ගාස්තු රු. 100 000 කි.

v. වෙළෙඳ ලැබිය යුතු දෑ වලින් රු. 80 000 ක් හානිකරන අලාභ ලෙස ඇස්තමේන්තු කර කපාහැරීමට තීරණය වී ඇත.

vi. 2024/03/31 දින චාරුක නව හවුල්කරුවෙකු ලෙස ව්‍යාපාරයට පැමිනි අතර ඔහු මුදල් රු. 800 000 හා රු. 1200 000 ක මෝටර් රථයක් ව්‍යාපාරයට රැගෙන එන ලදී. එය ශේෂ පිරික්සුමේ චාරුක යෙදූ වත්කම් ලෙස දක්වා ඇත. චාරුක බැදෙන දින ව්‍යාපාරයේ කීර්තිනාමය රු. 1000 000 කට තක්සේරු කළ අතර එය ප්‍රාග්ධන ගිණුමේ ගැලපීමට තීරණය විය.

